# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/6 - 2019 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2019.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් සිදුකරනු ලබන නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඇ) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් මධ්‍යම පළාත් අමාත්‍යාංශවල විෂයයන් සංශෝධනය කිරීමට කටයුතු සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *අනු අංකය* | *සංශෝධනයට පෙර පැවති පළාත් අමාත්‍යාංශ විෂයයන්* | *සංශෝධනය කිරීමෙන් පසු පළාත් අමාත්‍යාංශ විෂයයන්* |
|---|---|---|
| 01 | මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය | මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය |
| 02 | මධ්‍යම පළාතේ යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා කර්මාන්ත අමාත්‍යාංශය. | මධ්‍යම පළාතේ යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍යාංශය. |

ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

05 - 481


1A - PG 4503 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*